සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

2025-01

Learning Resource Centre R De Mazenod College Kandana 49078

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மேல் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education - Western Province

## වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
## ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
## Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි.

- I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පුද්ගලයෙකුට ලැබී ඇති සිවිල් අයිතිවාසිකමක් වන්නේ,
    1. ඡන්දය ප්‍රකාශ කිරීම. 2. දේශපාලන පක්ෂයකට බැඳීම.
    3. කැමති ආගමක් ඇදහීම. 4. රජයේ තනතුරු දැරීම.

02. ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයකු තුළ වර්ධනය වන ගුණාංගය කුමක් ද?
    1. විධාන පිළිපැදීම.
    2. චිත්තවේග/ සිතුවිලි පාලනය.
    3. ජීවිතයේ විවිධ අවස්ථා සෞන්දර්යාත්මකව දැකීම.
    4. විෂය දැනුම වර්ධනය වීම.

03. ජාතික කොඩියේ කහ පාට සිංහයාගේ සංකේතයෙන් පිළිබිඹු වන්නේ,
    1. ධාර්මික බව. 2. ජනවර්ග නියෝජනය.
    3. පැරණි සිංහල රාජකීය ධජය නියෝජනය ය. 4. සිංහල ජාතිය, සිංහල ජනතාවගේ විනය ගරුක බව ය.

04. ඔබේ පියාගේ මල්ලී සම්බන්ධව ඔබට තිබෙන ඥාතිත්වය කුමක් ද?
    1. මහප්පා. 2. බාප්පා. 3. මාමා. 4. ඥාති සහෝදරයා.

05. සිල්ලර වෙළෙඳ සැලක ප්‍රදර්ශනය කළ යුතු අත්‍යාවශ්‍ය පුවරුවකි,
    1. වෙළෙඳසැලෙහි නාම පුවරුව. 2. පාරිභෝගික මිල දර්ශනය.
    3. වෙළෙඳසැලෙහි ලියාපදිංචි අංකය. 4. මිල පාලන ප්‍රතිපත්ති.

- අංක 06 සිට 10 දක්වා දී ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. තම ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා පිහිටුවා ගන්නා වූ නිශ්චිත වූ නිවැරදි අධිෂ්ඨාන, ජීවන අරමුණු ලෙස හැඳින්වේ. ( )
07. තෛපොංගල් උත්සවය සමරනු ලබන්නේ ඉස්ලාම් භක්තිකයන් විසිනි. ( )
08. ඥාතීන් සමූහයකින් යුක්ත පරම්පරා තුනක හෝ ඊට වැඩි ගණනක සාමාජිකයන්ගෙන් සමන්විත පවුල් ඒකකය විස්තෘත පවුල වේ. ( )
09. පුද්ගලයා, සමාජය හා ජීවිතය සාරවත් කරන මානුෂික ගුණාංග සාරධර්ම වේ. ( )
10. මාධ්‍ය භාවිතයේදී ප්‍රචාරණය වන සියලු වැඩසටහන් අධ්‍යයනය කිරීම හෝ නැරඹීම වැදගත් වේ. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

11. ශිෂ්‍යයෙකු හොඳ අධ්‍යාපනයක් ලැබීම ජීවිත ................................ අත්‍යාවශ්‍ය සාධකයකි.
12. දෙමව්පියන් වෙනුවෙන් වග වෙමින් සියලු කාර්යයන් ........................ අකාරයෙන් ඉටුකර ගැනීම දරුවන්ගේ වගකීම වේ.

13. යම් ........................ සාර්ථකව ජය ගැනීම සඳහා පූර්ව සූදානමක් හා නිශ්චිත වැඩපිළිවෙලක් අනුගමනය කළ යුතුය.
14. රාජ්‍ය ලාංඡනය ............................ කර ඇත්තේ එස්. එම්. සෙනෙවිරත්න නැමැති චිත්‍ර ශිල්පියා විසිනි.
15. සෑම ජන සමාජයකම පුද්ගලයින් තම ............................ භුක්ති විඳීමේදී තම යුතුකම් ඉටු කිරීම කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

(නිර්මාණය, වගකීම, ගැටලුවක්, ඵලදායී, සාර්ථකත්වයට, අයිතිවාසිකම්, අභියෝගයක්)

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා (අ) හා (ආ) තීරු නිවැරදිව ගලපා පිළිතුරට අදාළ ඉංග්‍රීසි අක්ෂරය හිස්තැන මත ලියන්න.

| | | |
|---|---|---|
| 16. ඔබසතු හොඳ ගති ලක්ෂණයකි. | ( ) | A නිර්මාණශීලී චින්තනය. |
| 17. අභියෝග ජයගැනීමට වර්ධනයකර ගත යුතු ක්‍රියා මාර්ගයකි. | ( ) | B රාජ්‍ය ලාංඡනය. |
| 18. ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින බහු සංස්කෘතික ලක්ෂණයකි | ( ) | C අයිතිවාසිකමකි. |
| 19. ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේතයකි | ( ) | D කාරුණික බව. |
| 20. ආහාර හා පෝෂණය පවුලෙන් ඔබට ලැබෙන | ( ) | E විවිධ ජන වර්ග ජීවත් වීම. |

(2 × 20 = ල 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනිකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01.
1. වර්තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක දෙක නම් කරන්න. (ලකුණු.2)
2. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු.2)
3. පුරවැසියකු ඉටුකළ යුතු නීතිමය යුතුකම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු.2)
4. ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු.2)
5. පුද්ගලයකු තුළ වර්ධනය කළ යුතු සාරධර්ම දෙකක් නම් කරන්න. (ලකුණු.2)
6. ඔබේ ජීවිතයේ සාර්ථකත්වයට බලපාන හිතකර බලවේග දෙකක් නම් කරන්න. (ලකුණු.2)
7. ඇසුරුම් සහිත නිෂ්පාදන මිලදී ගැනීමේදී සැලකිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු.2)
8. ඔබ අසල්වාසීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන අවස්ථා දෙකක් ලියා දක්වන්න. (ලකුණු.2)

(2 × 8 = ල 16)

02.
1. ජන සමාජයක් විසින් අන්තර් සම්බන්ධතා පවත්වා ගෙන යනු ලබන සමිති දෙකක් නම් කරන්න (ලකුණු.2)
2. ජන සමාජයක පුරවැසියකු වශයෙන් ප්‍රගුණ කළයුතු උතුම් මානව ගුණාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු.4)
3. ජීවිත අභියෝග ජය ගැනීමට අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර, ඉන් එක් ක්‍රියාමාර්ගයක් සාර්ථකව ජය ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු.5)

03.
1. සංස්කෘතික අංග දෙකක් නම් කරන්න. (ලකුණු.2)
2. ශ්‍රී ලාංකික බහු සංස්කෘතිය තුළ දක්නට ලැබෙන ආගම් හතරක් සඳහන් කරන්න (ලකුණු.4)
3. සංස්කෘතික දායාද ආරක්ෂා කරගැනීම සඳහා පුරවැසියකු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු.5)

04.
1. සිංහල අවුරුදු උත්සවයකදී අනුගමනය කරනු ලබන චාරිත්‍ර විධි දෙකක් සඳහන් කරන්න. (ලකුණු.2)
2. ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා හතරක් නම් කරන්න. (ලකුණු.4)
3. ජාතික කොඩිය භාවිතයේදී නොකළ යුතු දේවල් දෙකක් නම් කොට, ඉන් එකක් විස්තර කරන්න (ලකුණු.5)

05. 1. රාජ්‍ය ලාංඡනය තුළ දක්නට ලැබෙන පහත සඳහන් සංකේතවලින් නිරූපනය වන දෑ අනුපිළිවෙලින් ලියන්න.

A. පුන්කලස. B. වී කරල්. (ලකුණු.2)

2. රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය වන අවස්ථා හතරක් සඳහන් කරන්න. (ලකුණු.4

3. ශ්‍රී ලාංකික අපට උරුම වී ඇති සංස්කෘතික දායාද දෙකක් නම් කරන්න. එම දායාද ආරක්ෂා කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු.5)

06. 1. ඔබ නැරඹූ හොඳ රූපවාහිනී වැඩසටහන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු.2)

2. පුද්ගලයා තුළ ඇතිවන චිත්තවේග හතරක් ලියා දක්වන්න. (ලකුණු.4)

3. වැඩ ලෝකය තුළ දක්නට ලැබෙන රැකියා අවස්ථා පහක් ලියන්න. (ලකුණු.5)

07. 1. දෙමාපිය දූදරු අන්තර් සම්බන්ධතා පවත්වන අවස්ථා දෙකක් A හා B රූප වලින් දැක්වේ. එම අවස්ථා දෙක හඳුනාගෙන නම් කරන්න. (ලකුණු.2)



A



B

2. දෛනික ජීවිතයේදී අපට වඩා වැදගත් වන තොරතුරු හතරක් ලියා දක්වන්න. (ලකුණු.4)

3. මිනිසා විසින් ප්‍රගුණ කළ යුතු උතුම් මානව ගුණාංග පහක් සඳහන් කරන්න. (ලකුණු.5)